**ශීර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය,එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණ බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 පොදු සම්මත ගිණුම්කරණ මූලධර්මවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කොළඹ ජාතික කෞතුකාගාරයේ ඉඩම් හා ගොඩනැගිලි පිළිවෙලින් රු.බිලියන 10 ක් හා රු.මිලියන 800 ක් ලෙස 2013 වර්ෂය පදනම් කර තක්සේරු වාර්තාවක් ලබාගෙන තිබුණ නමුත් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලද එම වටිනාකම දක්වා තිබූ අතර ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගනණය කිරීමේ ප්‍රතිපත්තිය ගිණුම්වලින් හෙළිදරව් කර නොතිබුණි. ඊට අමතරව දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශිය කෞතුකාගාර 8 ක ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු අගය හෝ පිරිවැය මත ගිණුම් ගත කර නොතිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කළ යුතු වීම හා දෙපාර්තමේන්තුවට අයත් සියලු ප්‍රාදේශීය කෞතුකාගාරවල ඉඩම් හා ගොඩනැගිලි පිරිවැයට හෝ තක්සේරු කළ අගයට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කළ යුතු වීම. | විගණන නිරීක්ෂණවලට එකඟතාවය දක්වන ලදී. |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විසර්ජන ගිණුමේ භාණ්ඩාගාර අග්‍රිමය 2017 වර්ෂය සඳහා රු.255,311,638 ක් වූ අතර එය 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2017 වර්ෂයට අදාළව රු.189,440,000 ක් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල පසුගිය වර්ෂයේ ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ශේෂයන් හා සංසන්දනාත්මකව නිවැරදිව පෙන්නුම් කළ යුතු වීම. | විගණන නිරීක්ෂණවලට එකඟතාවය දක්වන ලදී. |

**1.6.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

පහත සඳහන් කිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.10,460,915 ක් වැයකර තිබුණද මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ වර්ෂයේ මිලදී ගැනීම් ලෙස රු.2,277,632 ක් පමණක් දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය නොවන වත්කම් රු.8,183,283 කින් අඩුවෙන් දැක්වුණි. | සමාලෝචිත වර්ෂයේ අත්පත් කරගත් මූලධන වත්කම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල පෙන්විය යුතු වීම. | විගණන නිරීක්ෂණවලට එකඟතාවය දක්වන ලදී. |
| (ආ) 2017 වර්ෂයේ විසර්ජන ගිණුමේ මූල්‍ය නොවන වත්කම් සංචලන වාර්තාවේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.231,652,699 ක් ලෙස සටහන් වුවත් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආරම්භක ශේෂය ලෙස රු.15,065,148 ක් දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය නොවන වත්කම් රු.216,587,551 ක් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් පෙන්වා තිබුණි. | 2017 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂ 2018 ජනවාරි 01 දිනට මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්විය යුතු වීම. | -එම- |

**1.6.4 ලේඛන පොත්පත් පවත්වා නොතිබීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- | --- |
| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ | | |
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය/ මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර 11 වැනි පරිශිෂ්ඨය. | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ආ) | පරිගණක | 2002 නොවැම්බර් 28 | ලේඛනයක් | භාණ්ඩාගාර | විගණන |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා ගෙන ගොස් නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිරීක්ෂණ හා එකඟ වෙමි. |
| (ඈ) | ඇප ලේඛනය | මු.රෙ.891(1) | -එම- | මු.රෙ.891(1) ප්‍රකාරව ඇප ලේඛනය පවත්වා ගත යුතු වීම. | -එම- |
| (ඇ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මු.රෙ.454(2) | -එම- | මු.රෙ.454(2) ප්‍රකාරව ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | -එම- |
| (ඉ) | ඉන්ධන හා ලිහිසි තෙල් තොග පොත | මු.රෙ.1647(ඇ) | -එම- | මු.රෙ.1647 (ඇ) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | -එම- |
| (ඊ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මු.රෙ.1647 (ඉ) | -එම- | මු.රෙ.1647 (ඉ) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | -එම- |
| (උ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 | -එම- | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | -එම- |

## 1.6.5 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට අයත් ලක්සල ගොඩනැගිල්ල වෙනුවෙන් රු.602,217 ක් වරිපනම් ලෙස ගෙවා තිබුණද ගොඩනැගිල්ලේ තක්සේරු වාර්තාවේ මුල් පිටපත ඉදිරිපත් නොකෙරුණි . | ලක්සල ගොඩනැගිල්ලේ තක්සේරු වාර්තාවේ මුල් පිටපත විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. | විගණන නිරීක්ෂණ හා එකග වෙමි. |

## 1.6.6 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | විගණන නිරීක්ෂණ හා එකග වෙමි. |

**1.6.7 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

**-----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>----------------------- | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------- |
|---|---|---|
| මිලදී ගැනීම් ද ඇතුළුව ගෙවීම් කර ඇති වවුචර් 10 කට අදාළ නියැදි පරීක්ෂණයේදී එකතු කළ අගය මත බදු (VAT) ගෙවීම් රු.5,353,496 ක් ගෙවීම් වවුචර්වල සඳහන් කර නොතිබුණි. එම මුදල ඇතුළුව වර්ෂයේ එකතු කළ අගය මත බදු (VAT) ගෙවීම් පිළිබඳ විස්තර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 මාර්ගෝපදේශය ප්‍රකාරව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත වාර්තා කර නොතිබුණි. | එකතුකළ අගය මත බදු වවුචරයේ මුහුණතේ පෙන්විය යුතු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 මාර්ගෝපදේශය ප්‍රකාරව දේශීය ආදායම් කොමසාරිස්ට වාර්තා කළ යුතු වීම. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. |

**1.6.8 අවිධිමත් ගනුදෙනු**

**-------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>----------------------- | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>---------------------------- |
|---|---|---|
| (අ) මු.රෙ.139(4) අනුව සෑම ගෙවීම් වවුචරයකටම විධිමත් කුවිතාන්සියක් ලබා ගත යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දින ලියන ලද රු.18,104,879 වටිනා චෙක්පත් 11 ක් 2019 මැයි 27 දින වනවිටත් නිකුත් නොකර ගණකාධිකාරී වෙත රඳවා ගෙන තිබුණි. | මු.රෙ.139(4) ප්‍රකාරව සෑම ගෙවීමට විධිමත් කුවිතාන්සියක් ලබා ගත යුතු වීම. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. |
| (ආ) 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 05 ක හා 2018 වර්ෂයේ ක්‍රියාත්මක ව්‍යාපෘති 01 ක ඉතිරි වූ මුළු එකතුව රු.2,201,775 ක් දෙපාර්තමේන්තු ආපනශාලාව නවීකරණය කිරීමේ කටයුත්ත වෙනුවෙන් කොන්ත්‍රාත්කරුගෙන් හිලව් කර ගෙන තිබුණි. | ව්‍යාපෘතිය අවසානයේදී ඉතිරි මුදල් කොන්ත්‍රාත්කරුගෙන් ගෙන්වා ගැනීමට වැඩ පිළිවෙළක් සකස් කළ යුතු වීම. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවය හැරගිය නිලධාරින් 5 දෙනෙකුගෙන් අයවිය යුතු රු.544,309 ක් වර්ෂ 4 සිට වර්ෂ 5 දක්වා කාලයක් ඉකුත් වී ඇතත් එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මු.රෙ.501 (ඇ) ප්‍රකාරව ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | විගණන නිරීක්ෂණ හා එකග වෙමි. |

### 2.2 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබූ එහෙත් ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ට වැඩි කල් ඉකුත් වූ වටිනාකම රු.190,836 ක්වූ චෙක්පත් 12 ක් සම්බන්ධයෙන් මු.රෙ. 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මු.රෙ.396 (ඇ) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | විගණන නිරීක්ෂණ හා එකග වෙමි. |

**3. තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

**-----------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ------------------------ | ------------ | **---------------------------** |
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව තිබුණත් දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහි කර ගැනීමට අපොහොසත් වී තිබුණි. ඒ සඳහා වෙනත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කළ බවට ද, තොරතුරු ඉදිරිපත් නොවීය. | තිරසාර ඉලක්කයන් සපුරා ගැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් ඇති කරගෙන වෙනත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කළ යුතු වීම. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------ | ------------------------------ |
| අනුමත සේවක සංඛ්‍යාවෙන් 104 ක පුරප්පාඩු පැවතුණු අතර මෙම පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කළමනාකරීත්වය විසින් ගෙන නොතිබුණි. | පුරප්පාඩු වූ සේවකයන් බඳවාගෙන ආයතනයේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව සිදුකර යුතු වීම. | විගණන නිරීක්ෂණ හා එකග වෙමි. |